## 36 – සම්දුන් පුදන්න

සම්දුන් පුදන්න තුති ගී ගයන්න
නගන්න පියමං මැදුර කරා //

සමිඳෝ අප ආලෝකේ – එතුමෝ අප ආධාරේ
වීණා වයලා - ගී හඬ නගලා
පසසමු එතුමගෙ තෙද මහිමේ

සුදු පිලි ඇඳ සැරසීලා – රන් රිදියෙන් ඔප වීලා
සමගි වඩවලා – භේද දුරුලලා
පසසමු එතුමගෙ තෙද මහිමේ

කුල මල නැහැ සලගන්නේ – සැවොම දරුවො එතුමන්ගේ
සාමය බෙදලා – දරුකම වඩලා
පසසමු එතුමගෙ තෙද මහිමේ

දුප්පත් පොහොසත් වාදේ – ඉදිරියේ නැහැ එතුමන්ගේ
සැවොම එකා මෙන් – එකමුතු වී අපි
පසසමු එතුමගෙ තෙද මහිමේ

සුවඳ දුමින් ඔසවන්නේ – පැසසුම් වේ අප සැමගේ
මිහිරි හඬ නගා – සුපිරි හද පුරා
පසසමු එතුමගෙ තෙද මහිමේ